කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : 07 WW/TC/19/04/28/07
වර්ණය : ඇම්බර්

# 'ෆොනී' සුළි කුණාටුව පිලිබඳ අවවාදාත්මක නිවේදනය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්
2019 අප්‍රේල් මස 28 වන දින සවස 03.30 ට නිකුත් කරන ලදී.

## දිවයිනට සහ දිවයිනට නැගෙනහිර, ගිනිකොණ සහ උතුරු දෙසින් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ සඳහා

සැලකිලිමත් වන්න!

ගිනිකොණ දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ, ශ්‍රී ලංකාවට නැගෙනහිර දෙසින් පවතින සුළි කුණාටුව ('ෆොනී') අද (28 වන දින) පෙ.ව. 11.30 වන විට මඩකළපුව සිට නැගෙනහිර දෙසින් කි.මී 660 පමණ දුරින් උතුරු අක්ෂාංශ 7.4 ත් නැගෙනහිර දේශාංශ 87.8 ත් ආසන්නව ස්ථානගතව පවතී. මෙම පද්ධතිය ඉදිරි පැය 12 තුලදී චණ්ඩ සුළි කුණාටුවක් දක්වා වර්ධනය වේ යයි අනුමාන කෙරේ. මෙම පද්ධතිය ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළ තීරයට ඔබ්බෙන් වයඹ දෙසට ගමන් කර ක්‍රමයෙන් නැවත හැරී උතුරට බරව ඊසාන දෙසට ගමන් කරනු ඇතැයි අනුමාන කෙරේ.

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිලිබඳ අවධානය යොමුකරන ලෙස මහජනතාවගෙන් සහ ධීවර හා නාවුක ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

ගොඩබිම ප්‍රදේශ සඳහා:

මෙම සුළි කුණාටු පද්ධතියේ බලපෑම හේතුවෙන් ඉදිරි දින කිහිපයේ දිවයින හරහා (අප්‍රේල් මස 29 සිට මැයි 01 දක්වා) වැසි සහ සුළං තත්ත්වයේ වැඩිවීමක් අපේක්ෂා කෙරේ.

සබරගමුව, මධ්‍යම, දකුණු, බස්නාහිර සහ වයඹ පළාත්වල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. එම පළාත්වල මි. මී. 100-150ක පමණ තද වර්ෂාපතනයන් ඇති විය හැකි අතර, ස්ථාන කිහිපයක මි.මී.150 ට වැඩි ඉතා තද වර්ෂාපතනයන් ද ඇති විය හැක.

දිවයින හරහා විශේෂයෙන් උතුරු, උතුරුමැද, වයඹ සහ දකුණු පළාත්වලත් ත්‍රිකුණාමලය සහ අම්පාර දිස්ත්‍රික්ක වලත් විටින් විට හමන පැ. කි. මී. 70 දක්වා තද සුළං බලාපොරොත්තුවේ.




EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date: 2019-04-28
Time: 1630 hrs
D (Ops)/DO/ADO
DISASTER MANAGEMENT CENTRE

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology
TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

මුහුදු ප්‍රදේශ සඳහා:

2019 අප්‍රේල් 29 දින මුහුදු ප්‍රදේශ සඳහා අනාවැකිය

- ගාල්ල සිට හම්බන්තොට හරහා පොතුවිල් දක්වා සහ හලාවත සිට මන්නාරම හරහා කන්කසන්තුරය දක්වා වෙරළට ඔබ්බෙන් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවල පැ.කි.මී 40-50 දක්වා වන සුළං සමඟ විටින් විට හමන පැ.කි.මී 50-60 දක්වා වන ප්‍රහාරාත්මක සුළං බලාපොරොත්තුවේ. එම මුහුදු ප්‍රදේශ විටින් විට රළු වේ.

- මධ්‍යම-නිරිත දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශවල (පද්ධතියේ කේන්ද්‍රයේ සිට කි.මී. 200-300 අතර මුහුදු ප්‍රදේශවල) පැ.කි.මී (90-100) දක්වා වන සුළං සමඟ විටින් විට හමන පැ.කි.මී 120 දක්වා වන ප්‍රහාරාත්මක සුළං බලාපොරොත්තුවේ. එම මුහුදු ප්‍රදේශ දළ රළු සිට ඉතා දළ රළු වේ.

2019 අප්‍රේල් 30 සහ මැයි 01 දිනයන් සඳහා අනාවැකිය

- නිරිත දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශවල සහ නැගෙනහිර සහ ගිනිකොණ වෙරළ තීරයට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල(පද්ධතියේ කේන්ද්‍රයේ සිට කි.මී. 200-300 අතර මුහුදු ප්‍රදේශවල) 30 වන දින උදෑසන සිට පැ.කි.මී (120-130) දක්වා වන සුළං සමඟ විටින් විට හමන පැ.කි.මී 145 දක්වා වන ප්‍රහාරාත්මක සුළං බලාපොරොත්තුවේ.
- මැයි 01 දින සවස සිට නිරිත දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශවල සහ බටහිර-මධ්‍යම බෙංගාල මුහුදු ප්‍රදේශවල (පද්ධතියේ කේන්ද්‍රයේ සිට කි.මී. 200-300 අතර මුහුදු ප්‍රදේශවල) පැ.කි.මී (150-160) දක්වා වන සුළං සමඟ විටින් විට හමන පැ.කි.මී 175 දක්වා වන ප්‍රහාරාත්මක සුළං බලාපොරොත්තුවේ.
- දිවයින වටා මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය පැ.කි.මී. 50-60 වන සුළං සමඟ විටින් විට හමන පැ.කි.මී 70-90 දක්වා වන ප්‍රහාරාත්මක සුළං බලාපොරොත්තුවේ.

නාවුක සහ ධීවර ප්‍රජාව සඳහා නිවේදනය

- නිරිතදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ උතුරු කොටසේ සිටින ධීවරයින් සහ නාවුකයින් ආරක්ෂිත මුහුදු ප්‍රදේශ වෙත ගමන් කරන ලෙස උපදෙස් දෙනු ලැබේ.

- සෙසු මුහුදු ප්‍රදේශවල ධීවර කටයුතු වල යෙදෙන ධීවරයින් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිලිබඳ අවධානය යොමුකරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

Bulletin No: **07**
COLOR: **Amber**

WW/TC/19/04/28/07

## Advisory for Cyclonic Storm 'FANI'

Issued by the Natural Hazards Early Warning Centre
Issued at 03.30 p.m. 28th April 2019

### For Island and Deep and shallow sea areas to the east, southeast and north of Sri Lanka

### PLEASE BE AWARE!

**The cyclonic storm named 'FANI' (pronounced as FONI) over southeast Bay of Bengal to the east of Sri Lanka, was located near latitude 7.4N, Longitude 87.8E at 11.30 a.m. of 28th April 2019, about 660 km East of Batticaloa. It is likely to intensify further into a severe cyclonic storm during next 12 hours. The system is very likely to move northwestwards off east coast of Sri Lanka and thereafter recurve north-northeastwards gradually.**

**General public, Naval and fishing communities are requested to be attentive about future advisories issued by the Department of Meteorology in this regard.**

**FOR LAND AREA:**

**Under the influence of this system showery and windy condition will enhance over the island during next few days (29th April-01st May)**

**Showers or thundershowers at times with heavy falls about 100-150mm can be expected in the Sabaragamuwa, Central, Southern, Western and North-western provinces. Very heavy falls above 150mm are also likely at some isolated places in the above mentioned areas too.**

**Strong winds up to 70 km/h can be expected over the island particularly in Northern, North central, North-Western and Southern provinces and in Trincomalee and Ampara districts.**




EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2019-04-28
Time : 1630 hrs
D (Ops)/DO/ADO
DISASTER MANAGEMENT CENTRE

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**FOR SEA AREA:**

**Wind and sea condition forecast for 29th April 2019**

- **Wind speed will be (40-50) kmph in the deep and shallow Sea areas off the coast extending from Galle to Pottuvil via Hambantota and sea areas off the coast extending from Chilaw to Kankasanthurai via Mannar. Above sea areas can be rough at times as the wind speed can increase up to 60 kmph at times.**

- **Wind speed will be (90-100) kmph, gusting up to 120kmph over the Sea areas (within 200-300 km from the center of the system) in the central part of south-west Bay of Bengal and the said sea areas can be high to very high.**

**Wind and sea condition forecast for 30th April and 01st May 2019**

- **Wind speed will be (120-130) kmph gusting to 145 kmph over Southwest Bay of Bengal and sea areas off eastern and south eastern coast (within 200-300 km from the center of the system) from 30th morning;**
- **Wind speed will be (150-160) kmph gusting to 175 kmph over Southwest Bay of Bengal and west central Bay of Bengal sea area (within 200-300 km from the center of the system)on 01st May evening.**
- **Wind speed will be (50-60) kmph, gusting up to (70-90) kmph can be expected over the sea area around the island from 30th morning.**

## ADVISORY FOR NAVAL AND FISHING COMMUNITY

- **The fishermen are advised not to venture into deep and swallow sea areas off the coast extending from Galle to Kankasanturai via Batticaloa and Trincomalee until further noticed.**

- **The fishermen, who are in deep Sea of South-west Bay of Bengal, are advised to move safer sea areas.**

- **The fishermen at other sea areas are requested to be attentive on future advisories issued by the Department of Meteorology in this regard.**